


# අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව

## පෞද්ගලික අංශයේ සහභාගිත්වය ඇතිව ශ්‍රී ලංකාවේ වෛද්‍ය අධ්‍යාපනය පුළුල් කිරීම: තාක්ෂණය හා වෛද්‍ය විද්‍යාව පිළිබඳ දකුණු ආසියාතික ආයතනය (SAITM) ආදර්ශයක් ලෙස ගනිමින්

## උසස් අධ්‍යාපනය පිළිබඳ අනු කාරක සභාව

***2016 නොවැම්බර් මස 23 වැනි බදාදා***

# උසස් අධ්‍යාපනය පිළිබඳ ආංශික අධීක්ෂණ අනු කමිටුව

උසස් අධ්‍යාපනය, විද්‍යා හා තාක්ෂණ සහ පර්යේෂණ සහ කුසලතා සවංර්ධන යන අමාත්‍යාංශ අධීක්ෂණය කිරීම සඳහා ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ අධ්‍යාපනය සහ මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් උසස් අධ්‍යාපනය පිළිබඳ ආංශික අධීක්ෂණ අනු කමිටුව පත් කරන ලදී.

## වත්මන් සාමාජිකත්වය

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා (සභාපති)
ගරු ලසන්ත අලගියවන්න මහතා
ගරු සුජිත් සංජය පෙරේරා මහතා
ගරු මුජිබුර් රහුමාන් මහතා
ගරු අන්ගජන් රාමනාදන් මහතා
ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
ගරු චතුර සංදීප සේනාරත්න මහතා
ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා

## බලතල

පාර්ලිමේන්තුවේ ආංශික අධීක්ෂණ කාරක සභා වලින් එකක් වන මෙම කමිටුවට ඇති බලතල ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේදී 2015 දෙසැම්බර් 19 දින සම්මත කරන ලද යෝජනාවේ දක්වා ඇත. මේවා අන්තර්ජාලයේ www.parliament.lk මගින් ලබා ගත හැක.

## ප්‍රකාශන

කාරක සභාවේ වාර්තා හා සාක්ෂි පාර්ලිමේන්තුවේ නියෝගය මත පාර්ලිමේන්තු කාරක සභා කාර්යාලය මගින් ප්‍රකාශයට පත් කෙරේ. කාරක සභාවේ ප්‍රකාශන සියල්ල (පුවත්පත් නිවේදන ඇතුළුව) www.parliament.lk වෙබ් අඩවිය හරහා ලබා ගත හැක.

## කාරක සභා කාර්ය මඩුල්ල

කාරක සභාවේ වත්මන් කාර්ය මඩුල්ල - ටිකිරි කේ. ජයතිලක මහතා - පාර්ලිමේන්තු සහකාර මහලේකම්, ජගත් ගජවීරආරච්චි මහතා - අධ්‍යක්ෂ (ව්‍යවස්ථාදායක සේවා), ඉන්දිරා දිසානායක මහත්මිය - සහකාර අධ්‍යක්ෂ (පරිපාලන) - කාරක සභා කාර්යාලය, ඒ.ඇම්. නිලමුදීන් මහතා - ප්‍රධාන නිලධාරී, සුජීවී ගමගේ මහත්මිය- නියෝජ්‍ය ප්‍රධාන නිලධාරී

## දැනුම්දීම

සියළු ලිපිලේඛන උසස් අධ්‍යාපනය පිළිබඳ පාර්ලිමේන්තු අධීක්ෂණ අනු කමිටුව, කාරක සභා කාර්යාලය, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ වෙත යොමු කළ යුතුය. පොදු විමසීම් සඳහා දුරකථන අංකය 011 2777100 වේ.

**අධ්‍යාපනය සහ මානව සම්පත් සංවර්ධනය පිළිබඳ**
**ආංශික අධීක්ෂණ කාරක සභාවේ සාමාජිකයන්**

ගරු වඩිවේල් සුරේෂ් මහතා (සභාපති)
ගරු පියංකර ජයරත්න මහතා
ගරු ලසන්ත අලගියවන්න මහතා
ගරු ගාමිණී ලොකුගේ මහතා
ගරු නිහාල් ගලප්පත්ති මහතා
ගරු ශ්‍රීනාල් ද මැල් මහතා
ගරු කේ. තුරෙයිරෙත්නසිංහම් මහතා
ගරු සීනිතම්බි යෝගේස්වරන් මහතා
ගරු එස්. ශ්‍රීධරන් මහතා
ගරු වේලු කුමාර් මහතා
ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
ගරු සුජිත් සංජය පෙරේරා මහතා
ගරු මුහම්මදු ඉබ්රාහිම් මුහම්මදු මන්සූර් මහතා
ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
ගරු මුජිබුර් රහුමාන් මහතා
ගරු අංගජන් රාමනාදන් මහතා
ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
ගරු ඥානමුත්තු ශ්‍රිනේෂන් මහතා
ගරු චතුර සංදීප සේනාරත්න මහතා
ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා

# පටුන

වාර්තාව

සාරාංශය


1. **හැඳින්වීම......8**
   1.1 සයිටම් ආයතනය සම්බන්ධයෙන් පවත්නා වත්මන් ගැටළුව ......8
2. **රාජ්‍ය හා පෞද්ගලික ඒකබද්ධතාවය මගින් සයිටම් සිසුන්ගේ සායනික අවස්ථාව වැඩිදියුණු කිරීමේ යෝජනාව......10**
   2.1 පසුබිම ......10
   2.2 නෙවිල් ප්‍රනාන්දු ශික්ෂණ රෝහලේ රෝගීන් සංඛ්‍යාව වර්ධනය කර ගැනීමට ගත යුතු පියවර...10
   2.2.1 නෙවිල් ප්‍රනාන්දු ශික්ෂණ රෝහල රජයට පවරා ගැනීම ......10
   2.2.2 නෙවිල් ප්‍රනාන්දු ශික්ෂණ රෝහලේ කළමනාකාරිත්වය......11
   2.2.3 නෙවිල් ප්‍රනාන්දු ශික්ෂණ රෝහල් කාර්ය මණ්ඩල වැටුප් ......11
   2.2.4 නෙවිල් ප්‍රනාන්දු ශික්ෂණ රෝහලේ වෛද්‍ය සිසුන් සඳහා අතිරේක ශික්ෂණ රෝහල් ලෙස අවිස්සාවේල්ල, මුල්ලේරියාව සහ හොරණ රජයේ රෝහල් අනුබද්ධ කිරීම ......11
   2.2.5 සයිටම් සඳහා වෙන්වූ සෞඛ්‍ය වෛද්‍ය ප්‍රදේශයක් නම් කිරීම......12
   2.2.6 අධිකරණ වෛද්‍ය නිලධාරිවරයෙක් පත්කිරීම ......12
   2.3 ප්‍රමාද වූ සායනික පුහුණුවීම් අවසන් කිරීම ......12
   2.3.1 අවිස්සාවේල්ල මූලික රෝහල විශේෂ රෝග සියල්ල සඳහා අවසරදීම......12
   2.3.2 ශිෂ්‍ය කණ්ඩායමක් මුදාහැරීම......12
3. **සයිටම් වෛද්‍ය උපාධි වැඩසටහනේ ප්‍රමිතිය ආරක්ෂා කිරීම හා ක්‍රියාත්මක කිරීමේ ව්‍යුහය......13**
   3.1 සයිටම් වෛද්‍ය පීඨය සඳහා සිසුන් තෝරාගැනීමේ ක්‍රමවේදය......13
   3.2 සයිටම් ආයතනයේ කටයුතු අධීක්ෂණය සඳහා අධීක්ෂක මණ්ඩලයක් පත් කිරීම......13
   3.2.1 පසුබිම......13
   3.2.2 සයිටම් සඳහා නියාමන අධිකාරියක අවශ්‍යතාවය......13
   3.2.3 නියාමන අධිකාරියේ වගකීම්......14
   3.2.4 අධීක්ෂණ මණ්ඩලයේ යෝජිත සැකැස්ම......14
   3.3 විභාග ප්‍රමිතීන්......15
   3.3.1 සයිටම් ආයතනයේ වෛද්‍ය උපාධි සිසුන්ගේ අවසන් වසරේ විභාගය......15
4. **රජයේ වගකීම්......16**
   4.1 උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ හා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසන් සභාවේ වගකීම්......16
   4.2 සෞඛ්‍ය අමාත්‍යාංශයේ වගකීම්......16
   4.3 ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ වගකීම්......17
   4.4 සයිටම් ආයතනයේ වගකීම්......17
5. **ශ්‍රී ලංකාවේ පෞද්ගලික වෛද්‍ය විද්‍යා අධ්‍යාපනයේ ඉදිරි ව්‍යාප්තිය සඳහා වන දිගුකාලීන පියවර....18**
   5.1 පසුබිම......18

5.2 පෞද්ගලික වෛද්‍ය අධ්‍යාපනය ස්ථාපනය කිරීම ....................................................................18
5.3 රජයට අත්වන වාසි ........................................................................................................19

**6. නිගමන හා නිර්දේශ.......................................................................................................20**
6.1 නිගමන........................................................................................................................20
6.2 නිර්දේශ........................................................................................................................20

## සාරාංශය

ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ සාර්ථකත්වය එහි සක්‍රිය පොදු සේවය මත විශාල වශයෙන් රදා පවතී. රජය සියලු පුරවැසියන් හට නොමිලයේ සෞඛ්‍ය සේවා සළසන අතර රාජ්‍ය සෞඛ්‍ය ක්ෂේත්‍රය තුල සිටින විශේෂඥ වෛද්‍යවරුන් සංඛ්‍යාව ප්‍රමාණවත් නොවේ. මෙවැනි ප්‍රතිකාර ලබා ගැනීමට සිටින පෙරොත්තු ලේඛණය ඉතා දිගුය. ග්‍රාමීය හා නාගරික ප්‍රදේශ සේවා සැපයීම අතර පවතින විෂමතාවයට අමතරව, රටේ උතුරු නැගෙනහිර පළාත්වල ඇති යටිතල පහසුකම් රටේ සිවිල් යුද්ධයෙන් ඇතිවූ හානිය නිසා ඉතා අයපහත්ය. 2012 දත්ත වලට අනුව, රටේ සුදුසුකම්ලත් වෛද්‍යවරු මුළු සංඛ්‍යාව 17,129 (පුද්ගලයන් 1,187 කට එක් වෛද්‍යවරයෙකු බැගින්) කි. එසේ වුවද, ශ්‍රී ලංකාව තුල මනා සෞඛ්‍ය තත්ත්වයක් ඇති කිරීම සඳහා එය, පුද්ගලයන් 670 කට එක් වෛද්‍යවරයෙකු ලෙස වැඩි විය යුතුය. ලෝක සෞඛ්‍ය සංවිධානයේ නිර්දේශය අනුව, රට තුල වෛද්‍යවරුන් 40000 ක් සිටිය යුතු වුවද වෛද්‍යවරුන් 25000 ක හිගයක් ඇති බව පැහැදිලිය.

- **අප මෙම ගැටලුව විසඳා ගන්නේ කෙසේද?**

වසරකට වෛද්‍යවරුන් 1100 ක් පමණක් රාජ්‍ය වෛද්‍ය විද්‍යා පීඨ වලින් උපාධි ලබන බැවින් පරතරය පියවීම සඳහා තවත් 19 වසරක් පමණ ගත වේ. ජීවවිද්‍යා ධාරාවෙන් උසස් අධ්‍යාපනය හැදෑරීමට සුදුසුකම් ලබන ආසන්න වශයෙන් සිසුන් 82% කට රාජ්‍ය විශ්ව විද්‍යාල වලට යාමට අවස්ථාව අහිමි වේ. අද වන විට රට මුහුණ දෙන මූල්‍ය අර්බුදයට අනුව, රටේ වර්ධනය වන ඉල්ලුම සැපිරීමට අවශ්‍ය නව වෛද්‍ය පීඨ ඇරඹීමට රජයට හැකියාවක් නැත. එහි ප්‍රතිඵලයක් ලෙස ගාස්තු රහිත විශ්ව විද්‍යාල අධ්‍යාපනය ලබා ගත නොහැකි ශිෂ්‍යයන් 10,000 ක් පමණ විශ්ව විද්‍යාල අධ්‍යාපනය සඳහා විදේශ ගතවීම හෝ වාර්ෂිකව ශ්‍රී ලංකාව තුල සිට විදේශීය විශ්ව විද්‍යාල උපාධි හැදෑරීමට යොමුවේ. විදේශ විශ්ව විද්‍යාල අධ්‍යාපනය සඳහා මෙම රටින් බැහැර වන සිසුන් නිසාත් විදේශ රටවල ඉගෙනුම ලබන ශ්‍රී ලාංකික ශ්‍රමිකයන්ගේ දරුවන් තම උපාධියෙන් පසු පෙරලා රටට ආපසු නොඒම තුලින් රටින් බුද්ධි ගලනය ඉතා අධිකව සිදුවේ. වෘත්තීයවේදීන් වන මෙම සිසුන්ගේ දෙමාපියන්ද සිසුන් සමඟ රට හැර යන බැවින් සිසුන් මෙන්ම වෘත්තීයවේදී දෙමාපියන් ද රටට අහිමි වේ.

නොමිලේ අධ්‍යාපන ප්‍රතිපත්තියේ යථාර්තය පිළිබඳව සියුම් ලෙස විග්‍රහ කිරීමක් මගින් පෙන්නුම් කර ඇත්තේ අද වන විට සියයට සියයක නොමිලේ අධ්‍යාපනයක් ශ්‍රී ලංකාවේ නොමැති බවයි. නිදහස් අධ්‍යාපන ක්‍රමය යැයි කියා ගන්නා ක්‍රමය යටතේ පාසැල් ඇතුළුවීමේ ගාස්තු, ප්‍රාථමික සිට ද්විතියික පාසැල් මට්ටම දක්වා සෑම විෂයකට ම පාහේ පෞද්ගලික උපකාරක පංති ගාස්තු, වෙනත් ගාස්තු සහ වියදම් දෙමාපියන්ට දැරීමට සිදු වේ. එම නිසා ශිෂ්‍ය ප්‍රජාවගේ දැවෙන අවශ්‍යතා සැපිරීමට පුද්ගලික ආයතන සම්බන්ධ කර ගැනීම අත්‍යාවශ්‍ය වී ඇත. රෝහල්, ප්‍රවාහන (පෞද්ගලික බස්), ප්‍රාථමික හා ද්විතිය පාසැල් (පෞද්ගලික හා ජාත්‍යන්තර පාසැල්) වැනි පෞද්ගලික අංශයට රජය ඉඩ ලබා දී ඇති නිසා, විශ්ව විද්‍යාල පිහිටුවීමට ද රජය පුද්ගලික අංශයට අවස්ථාව සළසා දිය යුතුය. තිබෙන එකම පෞද්ගලික වෛද්‍ය විද්‍යාලය පවත්වාගෙන යාම පිළිබඳව ගැටලු සහගත තත්වයකට මුහුණුපා තිබෙන බැවින් ශ්‍රී ලංකාවේ තිබෙන ජාත්‍යන්තර පාසැල්වල ඉගෙනුම ලබන සිසුන්ට වෛද්‍ය විද්‍යාව සම්බන්ධයෙන් තම අධ්‍යාපනය ලබා ගැනීමට ඔවුන්ට රට හැර යාමට සිදුවේ. GMOA සහ රජයේ විශ්ව විද්‍යාල සිසුන් අතලොස්සක් රජයේ රෝහල්වල සායන පුහුණුව ලැබීමට සහ (SLMC) හි ලියාපදිංචි වීමට SAITM සිසුන්ට ඉඩ ලබා නොදෙති.

ශ්‍රී ලංකාවේ ඇති එකම පුද්ගලික වෛද්‍ය විද්‍යාලය තාක්ෂණය හා වෛද්‍ය විද්‍යාව පිළිබඳ අග්නිදිග ආසියානු ආයතනය (SAITM) යි. එසේ වුවද, මෙම සිසුන්ට ලියාපදිංචිය ලබා දීම ශ්‍රී ලංකා වෛද්‍ය සභාව (SLMC) ප්‍රතික්ෂේප කර ඇත.

තම සිසුන් හට ප්‍රමාණවත් සායනික පුහුණුවීම් තිබෙන බව සයිටම් ප්‍රකාශ කළද, ඊට ශ්‍රී ලංකා වෛද්‍ය සභාව එකඟ නොවේ. ශ්‍රී ලංකා වෛද්‍ය සභාව ඉල්ලා සිටින පරිදි විසඳාලීමට ඉතිරිව ඇති එකම ගැටළුව වන්නේ ප්‍රමාණවත් සායනික අවස්ථා ඇති කරලීමය. ශ්‍රී ලංකා වෛද්‍ය සභාව කිසිදු කොන්දේසි වලින් තොරව පිළිගනු ලබන විදේශීය වෛද්‍ය විද්‍යාලවල සිටින සිසුන් ලබන සායනික පුහුණුවට වැඩි සායනික පුහුණුවක් (SAITM) සිසුන් හට ලැබේ.

නිර්දේශ ලෙස පහත දැක්වෙන ක්‍රම තුන මගින් එය විසඳිය හැක. රාජ්‍ය පෞද්ගලික හවුල් ආයතනයක් ලෙස (SAITM) වෛද්‍ය සිසුන්ගේ සායනික අවස්ථා වැඩි කිරීම, අධීක්ෂණ අයතනයක් මගින් (SAITM) හි වෛද්‍ය උපාධියේ ප්‍රමිතිය පවත්වාගෙන යාම හා දිගුකාලීන පියවර ලෙස ශ්‍රී ලංකාවේ පුද්ගලික වෛද්‍ය අධ්‍යාපනයේ අනාගත ව්‍යාප්තිය යන නිර්දේශ යෝජනා කෙරේ.

රාජ්‍ය-පෞද්ගලික හවුල් ආයතනයක් ලෙස (SAITM) වෛද්‍ය සිසුන්ගේ සායනික අවස්ථා පුළුල් කිරීමේ යෝජනාව පහත දැක්වෙන පියවර මගින් ඉටු කර ගත හැක.

## නෙවිල් ප්‍රනාන්දු ශික්ෂණ රෝහල (NFTH රෝහල) රජයට පවරා ගැනීම

නෙවිල් ප්‍රනාන්දු ශික්ෂණ රෝහල **(NFTH රෝහල)** රජයට පවරාගෙන එය රජයේ රෝහලක් ලෙස පවත්වාගෙන යා යුතුය. නෙවිල් ප්‍රනාන්දු ශික්ෂණ රෝහලේ ඇති ඇඳන් 1000 න් ඇඳන් 100ක් මුදල් අය කරනු ලබන අංශයක් ලෙස වෙන් කළ යුතුය. අතිරේක ශික්ෂණ රෝහල් ලෙස අවිස්සාවේල්ල, මුල්ලේරියාව හා හොරණ රෝහල් සම්බන්ධ කළ යුතුය. (SAITM) සිසුන් සඳහා සායනික පුහුණුව සැපයීමට අදාළව ගාස්තුවක් පාර්ලිමේන්තු අධීක්ෂණ කාරක සභාවේදී සාකච්ඡා කිරීමෙන් අනතුරුව සෞඛ්‍ය අමාත්‍යාංශය සහ සයිටම් මගින් තීරණය කළ යුතුය. වෛද්‍ය විද්‍යාව උගන්වන පිරිස් සඳහා වඩාත් සුදුසු ලෙස කඩුවෙල හා වෙනත් එක් ප්‍රදේශයක් සෞඛ්‍ය වෛද්‍ය ප්‍රදේශයක් ලෙස වෙන් කළ යුතුය. ව්‍යෝහාරික වෛද්‍ය කටයුතු සඳහා සහභාගීවීමට මෙම රෝහල් වෙනුවෙන් අධිකරණ වෛද්‍ය නිලධාරියෙකු පත් කල යුතුය.

### *අතපසුවූ වැඩ කොටස් හැකි ඉක්මණින් අවසන් කළ යුතුය :*

පාර්ලිමේන්තු ආංශික අධීක්ෂණ කමිටුවේ දී සෞඛ්‍ය අමාත්‍යාංශය එකඟ වූ පරිදි ඖෂධ, සැත්කම්, නාරිවේද හා ප්‍රසව, මානසික චිකිත්සාව සහ අනු විශේෂතා වැනි වෙනත් ප්‍රධාන විශේෂ රෝගී තත්වයන් සඳහා අවිස්සාවේල්ල රෝහල භාවිතා කිරීමට සෞඛ්‍ය අමාත්‍යාංශය අවසර දිය යුතුය. (SAITM) සිසුන් මේවන විට ව්‍යෝහාර විද්‍යා හා මනෝ චිකිත්සාව සඳහා පමණක් අවිස්සාවේල්ල රෝහල යොදා ගන්නේ වුවද, අක්ෂි හා ENT වැනි උප අංශ රැසක් එම රෝහලේ ඇත. තවද, පළාතේ මහ රෝහල් හා මූලික රෝහල් කිහිපයකට ශිෂ්‍ය කණ්ඩායමක් යොමු කිරීම සම්බන්ධකළ යුතුය. කළුතර, ගම්පහ, කරවනැල්ල, වතුපිටිවල, නාවලපිටිය, මාතලේ හා නුවරඑළිය මේ සඳහා උචිත රෝහල් ලෙස තීරණය කර ඇත.

(SAITM) වෛද්‍ය උපාධි වැඩසටහනේ ප්‍රමිතිය ආරක්ෂා කිරීම ද වැදගත් කරුණක් වන අතර එමගින් රටේ පුද්ගලික වෛද්‍ය විද්‍යාල වල අනාගතය තීරණය වනු ඇත. ප්‍රමිතිය පවත්වාගෙනයාම සඳහා පහත සඳහන් පියවර ගත යුතුව ඇති අතර මේ සම්බන්ධව උසස් අධ්‍යාපන අමාත්‍යාංශයට වගකීම් රැසක් පැවරේ.

(SAITM) වෛද්‍ය විද්‍යාල සඳහා විධිමත් තේරීම් ක්‍රමවේදයක් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙහි සහාය ඇතිව තිබිය යුතුය. අවම අ.පො.ස උසස් පෙළ සුදුසුකම විය යුත්තේ උසස් පෙල විභාගයෙන් “සී” සාමාර්ථ 2 ක් හා එක් “එස්” සමාර්ථයක් හෝ ඊට සමාන ලන්ඩන් උසස් පෙල ප්‍රතිඵල වේ. එක් එක් දිස්ත්‍රික්කයෙන් රාජ්‍ය වෛද්‍ය පීඨවලට ඇතුලත්වීම අහිමිවන සිසුන් සඳහා සයිටම් ආයතනයට ඇතුළු කර ගන්නා සිසුන්ගෙන් 20%ක ප්‍රමාණයක අවස්ථා පූර්ණ ශිෂ්‍යත්ව ලෙස ලබාදිය යුතුය.

(SAITM) සඳහා නිරීක්ෂණ ආයතනයක් අධීක්ෂණ කමිටුව මගින් පත් කළ යුතු අතර, (SAITM) හි නව ව්‍යුහය මනාව ක්‍රියාවට නැංවෙන තෙක් එය ප්‍රධාන අධිකාරිය ලෙස එය පැවතිය යුතුය. (SAITM) සිසුන්ගේ වෛද්‍ය උපාධි අවසන් විභාගය, රජයේ වෛද්‍ය විද්‍යා පීඨ සඳහා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම මගින් නියම කර ඇති මාර්ගෝපදේශ හා ප්‍රමිති වලට අනුව පැවැත්විය යුතුය. 2016 වසරේ පැවති පළමු හා දෙවන අවසන් වෛද්‍ය උපාධි විභාග මෙම ක්‍රමය අනුව සිදු කරනු ලැබිනි.

ශ්‍රී ලංකාවේ පුද්ගලික වෛද්‍ය ආයතනවල ඉදිරිකාලින ව්‍යාප්තිය සඳහා වූ දිගුකාලින පියවර වන්නේ රජයේ වෛද්‍ය පීඨවලට සම්බන්ධිත ගාස්තු අය කරන වෛද්‍ය විද්‍යාල ඇරඹීමයි.

# 1. හැඳින්වීම

විශ්ව විද්‍යාල වලට ඇතුලත් වීමට සුදුසුකම් ලබන ආසන්න වශයෙන් 82% ක් වන ශ්‍රී ලංකාවේ ශිෂ්‍යයන් විශාල සංඛ්‍යාවක් අපගේ විශ්ව විද්‍යාලවල උපාධි අපේක්ෂකයන් වීමට අවස්ථාව නොලබයි. එබැවින් රාජ්‍ය විශ්ව විද්‍යාල සංඛ්‍යාව රටේ ඉහළ යන ඉල්ලුම සපුරා ලීමට නොහැකි වි ඇත. රාජ්‍ය විශ්ව විද්‍යාලවල අවස්ථාවන් නොලබන සිසුන්ගේ මානසික තත්වය සැළකිල්ලට ගත් විට කල් දැමිය නොහැකි දැවෙන ප්‍රශ්ණයක් බවට මෙය පත් ව ඇත.

රාජ්‍ය විශ්ව විද්‍යාල වලට අවස්ථා නොමැති ශිෂ්‍ය ප්‍රජාවගේ අවශ්‍යතා සපුරාලීම සඳහා පුද්ගලික ආයතන හඳුන්වාදීම අත්‍යාවශ්‍යය වි ඇත. මූල්‍ය බාධක හේතුකොටගෙන එවැනි විශ්ව විද්‍යාලවල වැඩි අවස්ථා ප්‍රමාණයක් ඇති කර දීමට රජයට ද හැකියාවක් නැත.

එබැවින් සිසුන්ගේ උසස් අධ්‍යාපනය සඳහා වැඩි අවස්ථා/ මාර්ග සැකසීමටත් සැපයුම හා ඉල්ලුම අතර පරතරය අවම කිරීම සඳහා ක්ෂණික විසඳුම් සෙවීම වඩාත් කාලෝචිතය.

රටේ සෞඛ්‍ය පහසුකම් වර්ධනය කිරීම සඳහා ප්‍රධාන බාධකය වී ඇත්තේ වෛද්‍යවරුන්ගේ උග්‍ර හිඟයයි. වසර 2009 වන තෙක් රට තුල කිසිදු පුද්ගලික වෛද්‍ය විද්‍යාලයක් නොමැතිවීම නිසා ඉල්ලුම හා සමාජයීය සාධක හේතුකොටගෙන ශිෂ්‍යයන් විශාල සංඛ්‍යාවක් වෛද්‍ය වෘත්තියට අවතීර්ණවීම සඳහා විදේශීය විශ්ව විද්‍යාලවල සරණ පතති. ආර්ථික ලෙස ගත් කල, විදේශ විනිමය සංචිත අහිමිවීම හා බුද්ධි ගලනය නිසා එය රටට බරක් වි ඇත. තවද, මෙවැනි විදේශීය විශ්ව විද්‍යාල බහුතරයක් මගින් බාල ප්‍රමිතියෙන් යුත් වෛද්‍ය අධ්‍යාපනයක් ලබා දීම සිදු වේ. විදේශීයව සුදුසුකම්ලත් වෛද්‍ය උපාධිධාරීන්ට තම පිළිගැනීම ලබා දීමට පෙර ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් පැවැත්වූ ERPM විභාග වලින් බහුතරයක් අසමත්වීම තුළින් මෙය පැහැදිලිව ඔප්පු කර ඇත.

ශ්‍රී ලංකාවේ දැනට ඇති එකම පෞද්ගලික වෛද්‍ය විද්‍යාලය වන්නේ (SAITM) ය.

(SAITM) හි පළමු වෛද්‍ය සිසුන් කණ්ඩායම වෛද්‍ය උපාධිය ලබා ඇත. එසේ වුවද, මෙම සිසුන්ට ව්‍යවස්ථාමය පිළිගැනීම ලබාදීම ශ්‍රී ලංකා වෛද්‍ය සභාව ප්‍රතික්ෂේප කිරීම මගින් ශ්‍රී ලංකාවේ වෛද්‍යවරයෙකු ලෙස සේවය කිරීම අහිමි කර ඇත.

(SAITM) සිසුන්ට ප්‍රමාණවත් සායනික පුහුණුව ලැබීමට අවස්ථාව තිබුනා වුවද, ඒ බව ශ්‍රී ලංකා වෛද්‍ය සභාව පිළි නොගනී. වෛද්‍ය නෙවිල් ප්‍රනාන්දු ශික්ෂණ රෝහලේ සිදු කරන සායනික පුහුණුවීම් පමණක් ශ්‍රී ලංකා වෛද්‍ය සභාව සැලකිල්ලට ලක් කළද ආසිරි සර්ජරිස්, ලංකා හොස්පිටල්ස්, නවලෝක රෝහල හා ඕවසිස් රෝහල වැනි කොළඹ පිහිටි ප්‍රධාන පෙළේ පුද්ගලික රෝහල් තුල සායනික පුහුණුව (SAITM) සිසුන්ට ලබා දේ. මෙය මෙරට ප්‍රධාන පෙළේ උපදේශකයන්ගේ අධීක්ෂණය යටතේ සිදුවේ.

## 1.1 (SAITM) ආයතනයේ වත්මන් ගැටලුව

(SAITM) ආයතනයේ වෛද්‍ය උපාධිය පිළිගැනීමට එරෙහිව තිබූ ගැටළු ශ්‍රී ලංකා වෛද්‍ය සභාව මගින් පත්කළ කමිටුව මගින් සැළකිය යුතු ලෙස විසඳී ඇත (අවිස්සාවේල්ල මූලික රෝහලේ වෝහාරික වෛද්‍ය හා ප්‍රජා

වෛද්‍ය අංශවල සහ කඩුවෙල සෞඛ්‍ය නිළධාරි කාර්යාලයට අදාලව). ශ්‍රී ලංකා වෛද්‍ය සභාවට පිළිගත හැකි පරිදි විසඳීමට ඇති එකම ගැටලුව වන්නේ ප්‍රමාණවත් නොවන සායනික පුහුණුව අවස්ථාවන්ය.

මෙම පත්‍රිකාවේ අරමුණ පහත දැක්වෙන ප්‍රධාන පරමාර්ථ තුන යටතේ ගත යුතු පියවර සාකච්ජාවට ලක් කිරීමයි.

I. (SAITM) වෛද්‍ය සිසුනගේ සායනික අවස්ථා පුළුල් කිරීම
II. (SAITM) හි වෛද්‍ය උපාධි වැඩසටහනෙහි ප්‍රමිතිය පවත්වාගෙනයාම
III. ශ්‍රී ලංකාවේ අනාගත පුද්ගලික වෛද්‍ය අධ්‍යාපන අවශ්‍යතාවයන් පුළුල් කිරීම

ඉහත දැක්වෙන පරමාර්ථ තුන පහත දැක්වෙන ප්‍රධාන ක්‍රමවේද යටතේ විසඳිය හැක.

- පුද්ගලික-රාජ්‍ය සහයෝගිතාවය
- මෙහෙයුම් ආයතනය
- දිගුකාලීන පියවර

# 2. රාජ්‍ය-පෞද්ගලික සහයෝගිතාවය මගින් සයිටම් වෛද්‍ය සිසුන් සඳහා සායන අවස්ථාව වැඩිදියුණු කිරීමේ යෝජනාව

## 2.1 පසුබිම

(SAITM) වෛද්‍ය සිසුන්ට සායනික පුහුණුව ලබා දෙන දැනට ඇති ප්‍රධාන ශික්ෂණ රෝහල වන්නේ නෙවිල් ප්‍රනාන්දු ශික්ෂණ රෝහලයි. එය රටේ ප්‍රමුඛ පෙළේ වෛද්‍යවරුන් සිටින හා අංග සම්පූර්ණ රෝහලක් වුවද, නෙවිල් ප්‍රනාන්දු ශික්ෂණ රෝහලේ පිහිටීම හා අයකරන ගාස්තුව අනුව ප්‍රතිකාර සඳහා පැමිණෙන රෝගීන් සංඛ්‍යාව අඩුය. තවද, විශේෂයෙන් හදිසි අනතුරු හා හදිසි අවස්ථා සඳහා රෝගීන් රජයේ රෝහල් වලට වැඩි ප්‍රවනතාවයක් දැක්වීම නිසා හදිසි අනතුරු හා හදිසි අවස්ථා පිළිබඳව සයිටම් ශිෂ්‍යයන්ට ඇති අවස්ථා විරලය. රෝගීන් ප්‍රමාණය අවම වූ නෙවිල් ප්‍රනාන්දු ශික්ෂණ රෝහලේ ශිෂ්‍ය සංඛ්‍යාව මුල් කණ්ඩායම් සඳහා ප්‍රමාණවත් වුවද, වැඩි ශිෂ්‍ය ප්‍රමාණයක් මෑතකදී බඳවාගත් කණ්ඩායම් වල සිටින බැවින් සාර්ථක සායනික පුහුණුවක් ලබාදීම සඳහා ප්‍රමාණවත් නොවේ. එබැවින් වෛද්‍ය නෙවිල් ප්‍රනාන්දු ශික්ෂණ රෝහලේ රෝගීන් සංඛ්‍යාව වැඩි කර ගැනීමේ දැඩි අවශ්‍යතාවයක් ඇති වී ඇත.

## 2.2 NFTH රෝහලේ රෝගීන් සංඛ්‍යාව වර්ධනය කිරීමට ගත යුතු පියවර

### 2.2.1 NFTH රෝහල රජයට පවරා ගැනීම

පැන නැගී ඇති ගැටලුව විසඳීමට කඩිනම් පියවරක් ලෙස නෙවිල් ප්‍රනාන්දු ශික්ෂණ රෝහල රජයට පවරා ගත හැක. එහි අද වන විට ඇඳන් 1000 ක් ඇති අතර ඉන් ඇඳන් 100 ක් හැර ඉතිරි 900 ගාස්තු රහිතව ජනයාට ලබා දිය යුතුය. ශ්‍රී ලංකා ජාතික රෝහලේ මෙන් නෙවිල් ප්‍රනාන්දු ශික්ෂණ රෝහලේ ගෙවන වාට්ටුව ලෙස එහි ඉතිරි ඇඳන් 100 වෙන් කළ යුතුය. නොමිලේ ලබා දෙන ඇඳන් 900 න් ඇඳන් 400 ක් වෛද්‍ය, සැත්කම්, නාරිවේද හා ප්‍රසව විද්‍යා, ළමා රෝග, මනෝ රෝග වැනි වෘත්තීය ඒකක (ඒකකට ඇඳන් 80 බැගින්) පහකට ලබා දිය යුතුය.

අනෙක් ඇඳන් 400 අතුරින් වෛද්‍ය, සැත්කම්, නාරිවේද හා ප්‍රසව විද්‍යා, ළමා රෝග, මනෝ රෝග (උක්ත අන්දමට එක් ඒකකයට ඇඳන් 80 බැගින්) එක් එක් ඒකකය සඳහා ඇඳන් වෙන් කළ යුතුය. මෙම ඒකක වල ප්‍රධානීත්වය සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් පත් කරන උපදේශකවරුන් විසින් දැරිය යුතුය. ඉතිරි කොටස ENT, අක්ෂි හා විකලාංග වැනි අත්‍යාවශ්‍ය උප විශේෂිත අංශ සඳහා වෙන් කළ යුතුය. මෙම ඒකක සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් පත් කළ (SAITM) අධ්‍යයන කාර්ය මණ්ඩලය හෝ උපදේශකවරුන් විය හැක. පුද්ගලික අංශයේ (ගෙවන වාට්ටුව) ඇඳන් 100 ක් සඳහා (SAITM) හි අධ්‍යයන කාර්ය මණ්ඩලයට අනුබද්ධව සිටින රෝගීන් හට ප්‍රමුඛත්වය ලබා දිය යුතුය. විශ්‍රාමලත් විශේෂඥ වෛද්‍යවරු සියලු දෙනා හට පුද්ගලික කොටසේ වැනල් කිරීමේ නිරත විය හැක.

### 2.2.2. නෙවිල් ප්‍රනාන්දු ශික්ෂණ රෝහලේ (NFTH) කළමනාකාරිත්වය

රෝහල් අධ්‍යක්ෂවරයා සහ කළමනාකරණ මණ්ඩලය සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය මගින් පත්කරනු ලබයි. කලමනාකරණ මණ්ඩයේ සංයුතිය පහත සඳහන් පරිදි විය යුතුය.

- ප්‍රධාන විධායක නිලධාරියෙකු (CEO)
- සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය විසින් නම් කරනු ලබන පුද්ගලයෙක්
- උසස් අධ්‍යාපන සහ මහාමාර්ග අමාත්‍යාංශය විසින් නම් කරනු ලබන පුද්ගලයෙක්
- මුදල් අමාත්‍යාංශය විසින් නම් කරනු ලබන පුද්ගලයෙක්
- අග්‍රාමාත්‍යතුමා විසින් නම් කරනු ලබන පුද්ගලයින් හතරදෙනෙක්

මෙම මණ්ඩල සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක වන තෙක් මෙම වෙනස සම්බන්ධයෙන් කටයුතු උසස් අධ්‍යාපන හා මානව සම්පත් සංවර්ධන පාර්ලිමේන්තු අධීක්ෂණ කාරක සභාව මගින් අධීක්ෂණය කෙරෙනු ඇත. තවද, එය මගින් නෙවිල් ප්‍රනාන්දු ශික්ෂණ රෝහල සහ SAITM වෛද්‍ය විද්‍යාලය අතර පහසු ක්‍රියාකාරිත්වය සහතික කරයි.

### 2.2.3 නෙවිල් ප්‍රනාන්දු ශික්ෂණ රෝහලේ කාර්ය මණ්ඩලයේ වැටුප්

වෘත්තික ඒකක වල උපදේශකයන් සහ කාර්ය මණ්ඩලයේ (මහාචාර්යවරු, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරු) වැටුප් ගෙවීම SAITM මගින් සිදුකරනු ඇත.

සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය මගින් පත් කරන ලද වෛද්‍ය උපදේශකයන්, වෛද්‍ය නිලධාරීන්, හෙදියන්, අතුරු වෛද්‍ය, කම්කරු සහ කාර්ය මණ්ඩලය සඳහා වැටුප් ගෙවීම සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය විසින් දැරිය යුතුය. රටේ අනෙකුත් ශික්ෂණ රෝහල්වල පිළිවෙල එය වේ. සියලුම අතරමැදි ශ්‍රේණිවල වෛද්‍යවරු SR, ලේඛකාධිකාරීන් සහ SHO සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය මගින් පත් කරනු ලබයි. හෙද කාර්ය මණ්ඩලය, අතුරු වෛද්‍ය, සුලු සේවක කාර්ය මණ්ඩලය සහ කාර්යාලයේ කාර්ය මණ්ඩලය සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය මගින් පත් කරන ලබයි.

මුදල් අයකරන අංශයෙන් ලැබෙන ආදායම රෝහලේ සංවර්ධනය උදෙසා යෙදවිය යුතුය.

### 2.2.4 නෙවිල් ප්‍රනාන්දු ශික්ෂණ රෝහලේ වෛද්‍ය සිසුන් සඳහා අතිරේක ශික්ෂණ රෝහල් ලෙස අවිස්සාවේල්ල, මුල්ලේරියාව සහ හොරණ රජයේ රෝහල් අනුබද්ධ කිරීම

සායන පුහුණු ලැබීමට බලාපොරොත්තුව සිටින සිසුන් විශාල සංඛ්‍යාවක් සිටින බැවින් මෙම රෝහල් අනුබද්ධ කිරීම අත්‍යාවශ්‍යය. ජ්‍යෙෂ්ඨ සිසුන් දැනටමත් නෙවිල් ප්‍රනාන්දු ශික්ෂණ රෝහලේ සායන පුහුණුවල නිරතව සිටින අතර දැනට සායන පුහුණුව ලැබිය යුතු ශිෂ්‍ය කණ්ඩායම් තුනක් සිටින නමුත් සායන පුහුණු පහසුකම් නොමැති හේතුව මත නියමිත කලට පුහුණුව ආරම්භ කිරීමට නොහැකි වී ඇත. ජ්‍යෙෂ්ඨ සිසුන් ද නියමිත සායන පුහුණු සංඛ්‍යාව මේ වනතෙක් සම්පූර්ණ කර නොමැත. මෙම රජයේ රෝහල්වල සායනික පුහුණුව ලබන සෑම සිසුවෙක් වෙනුවෙන් ම SAITM විසින් ගාස්තු ගෙවිය යුතුය. ( දැනටමත් KDU, ශ්‍රී ජයවර්ධනපුර

රෝහලට නියමිත මුදලක් ගෙවයි.) රජය සහ SAITM යන දෙකටම මෙම රෝහල් සංවර්ධනය සඳහා දායක විය හැක.

### 2.2.5 SAITM සිසුන් සඳහා MOH ප්‍රදේශයක් නම්කිරීම

SAITM වෛද්‍ය පීඨයේ MOH ප්‍රදේශය ලෙස ශික්ෂණ කාර්යයන් වෙනුවෙන් ප්‍රජා වෛද්‍ය අංශයේ කාර්ය මණ්ඩලයට පහසු ප්‍රවේශයක් තිබෙන කඩුවෙල ප්‍රදේශය වෙන් කිරීම සුදුසුය.

### 2.2.6 අධිකරණ වෛද්‍ය නිලධාරි (JMO)

අධිකරණ වෛද්‍ය විද්‍යාව අධ්‍යාපනය සඳහා තෝරාගන්නා SAITM සිසුන් සඳහා ඉහත සඳහන් කරන ලද රජයේ රෝහල් තුනෙන් එකකට අධිකරණ වෛද්‍ය නිලධාරියකු පත් කරනු ලැබේ .

## 2.3 අතපසු වූ වැඩ අවසන් කිරීම (මේ සම්බන්ධයෙන් කඩිනමින් කටයුතු කිරීම අවශ්‍යය)

### 2.3.1 සියලුම විශේෂ වෛද්‍ය අංශ සඳහා අවිස්සාවේල්ල මූලික රෝහල භාවිත කිරීමට අවසරය

මෙම දැවෙන ප්‍රශ්නයට කඩිනම් විසඳුමක් වශයෙන් වෛද්‍ය, ශල්‍යකර්ම, ප්‍රසව විද්‍යාව සහ නාරි හා ප්‍රසව වේදය, ළමා සහ වෙනත් විශේෂඥ අංශ වැනි වඩා විශේෂ වූ සායනික පුහුණු සඳහා තීරණය කරන ලද නියමිත ගාස්තු ගෙවා අවිස්සාවේල්ල රෝහල භාවිත කිරීමට සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය විසින් අවසර දිය යුතුය. දැනට අධිකරණ වෛද්‍ය විද්‍යාව සහ මනෝ වෛද්‍ය විද්‍යාව සඳහා පමණක් සායනික පුහුණුව සඳහා SAITM සිසුහු අවිස්සාවේල්ල මූලික රෝහල භාවිත කරති.

### 2.3.2 සිසු තදබදය ලිහිල් කිරීම

පවතින තදබදය ලිහිල් කිරීමට පලාත්වල මහ රෝහල් සහ මූලික රෝහල් කීපයකට සිසුන් අනුයුක්ත කළ හැක. අතපසු වූ වැඩ අවසන් කිරීමට කලුතර, ගම්පහ, කරවනැල්ල, වතුපිටිවල, නාවලපිටිය, මාතලේ සහ නුවරඑළිය රෝහල් භාවිත කිරීමට සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය ප්‍රතිපත්තිමය වශයෙන් එකඟ වී ඇත. මෙම රෝහල් දැනට රජයේ වෛද්‍ය විද්‍යාල සිසුන් විසින් සායන පුහුණු සඳහා භාවිත නොකරනු ලබයි.

*<u>අවශ්‍ය යටිතල පහසුකම් සහ කාර්ය මණ්ඩලය තිබෙන බැවින් මෙය කඩිනමින්ම ක්‍රියාත්මක කළ හැක.</u>*

*කුරුණෑගල මහ රෝහල, ගම්පොල, මාවනැල්ල සහ කෑගල්ල මූලික රෝහල් පේරාදෙණිය වෛද්‍ය පීඨයට අනුබද්ධ කරමින් මෙවැනි පියවරක් මීට පෙර ගෙන ඇත. මේවා දැනට ශික්ෂණ රෝහල් ලෙස නම්කර ඇත.*

# 3. SAITM වෛද්‍ය උපාධි වැඩසටහන් ප්‍රමිතිය ආරක්ෂා කිරීම ක්‍රියාත්මක කිරීම

## 3.1 SAITM වෛද්‍ය උපාධි පීඨය සඳහා සිසුන් තෝරා ගැනීමේ නිර්ණායක

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම සමග සහයෝගයෙන් විධිමත් තෝරාගැනීමේ නිර්ණායක අනුගමනය කළ යුතුය. සියලුම අයදුම්කරුවන්ට අ.පො.ස. (උ/පෙළ) විභාගයෙන් ජීව විද්‍යා අංශයෙන් සම්මාන සාමාර්ථ 2 ක් සහ සාමාන්‍ය සාමාර්ථයක් හෝ ලන්ඩන් (උ/පෙළ) විභාගයේ ඊට සමාන සාමාර්ථ තිබිය යුතුය.

විෂය බාහිර ක්‍රියාකාරකම්වල දක්ෂතා වැනි රජයේ විශ්ව විද්‍යාල සඳහා අනුගමනය කරන අනෙකුත් සියලුම නිර්ණායක සලකා බැලිය හැක. ඉංග්‍රීසි භාෂාවේ ප්‍රවීණතාවය තිබිය යුතුය. මුලු සංඛ්‍යාවෙන් නිශ්චිත ප්‍රතිශතයක් වෘත්තීයවේදීන් සහ බදු ගෙවන්නන්ගේ දරුවන් සඳහා වෙන්කළ හැක.

රජයේ වෛද්‍ය පීඨ වලට ඇතුළත් වීමේ Z ලකුණු යම්තමින් අහිමි වූ සිසුන් සඳහා 20% පූර්ණ ශිෂ්‍යත්ව එක් එක් දිස්ත්‍රික්කයෙන් ලබා දිය යුතුය.

## 3.2 SAITM ආයතනයේ කටයුතු අධීක්ෂණය කිරීම සඳහා අධීක්ෂක මණ්ඩලයක් ස්ථාපිත කිරීම

### 3.2.1 පසුබිම

රජයේ විශ්ව විද්‍යාලවල අධ්‍යයන, මූල්‍ය ආදී සියලු කටයුතු පීඨ මණ්ඩල, සෙනේට් සහ සභාව යන විවිධ ආකාරයෙන් අධීක්ෂණය කරනු ලබයි. අධ්‍යයන සම්බන්ධ කටයුතු සෑම අධීක්ෂණ ආයතනයක් මගින්ම දැඩිව අධීක්ෂණය කෙරෙන අතර අධ්‍යයන කාර්ය මණ්ඩලය අධීක්ෂණ ආයතන මගින් සකස් කර ඇති ප්‍රමිති අනුගමනය කිරීමට බැඳී සිටී. විශ්වවිද්‍යාල පාලන තන්ත්‍රය තුල විශ්වවිද්‍යාල සභාව විධායක ආයතනය වන අතර එය උප කුලපතිවරයාට උපදෙස් ලබාදෙන ආයතනයකි. අවසාන වශයෙන් විශ්ව විද්‍යාල සභාව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම (UGC) සහ උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය යටතට ගැනේ. විශ්ව විද්‍යාලයේ ප්‍රධාන පාලන ආයතනය වශයෙන් මෙම සභාව එහි යහපත් කළමනාකරණය සහ සුභ සිද්ධිය සහතික කිරීමට සියලුම මූල්‍ය කටයුතු, අධ්‍යයන ක්‍රියාකාරකම් සඳහා වගකීම් දරයි.

### 3.2.2. SAITM ආයතන සඳහා අධීක්ෂණ මණ්ඩලයක් පිළිබඳ සංකල්පය : එය අවශ්‍ය වන්නේ ඇයි?

SAITM වෛද්‍ය පීඨයේ පීඨාධිපති විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ ස්ථාවර කාරක සභා රැස්වීම් වලට සහභාගි වුවද ඔහු/ඇය රජයට අයත් වෛද්‍ය පීඨයක පීඨාධිපති ලෙස වි.වි.ප්‍රතිපාදන කොමිසමට බැඳී නොසිටී. ඒ මන්ද යත්, පීඨාධිපති සහ අනෙක් ප්‍රධාන නිලධාරීන් පත්කරන බලධාරීන් වනුයේ සභාපති සහ මෙම සමාගමේ අයිතිකරුවන් වන SAITM හි අධ්‍යක්ෂ මණ්ඩලය වන බැවිනි. එමනිසා, මෙම ප්‍රධාන තනතුරු අතර

ඉතාමත් සුදුසු පුද්ගලයන් සිටිනවා ද යන්න සැක සහිතය. නමුත්, රජයේ විශ්ව විද්‍යාලවල පීඨාධිපති දෙපාර්තමේන්තු ප්‍රධානීන් අතරින් වැඩි ඡන්දයෙන් තෝරා පත්කරනු ලබයි. SAITM හි පාලන අධිකාරිය වන්නේ සභාපති, කුලපතිවරයා (වෛද්‍ය නෙවිල් ප්‍රනාන්දු මහතා) ය. රජයේ විශ්ව විද්‍යාලයේ මෙන් පරිපාලනයේ මෙම ඒකාධිකාරය වගකිවයුතු සාමාජිකයන් කීපදෙනෙකු අතර තුලිත විය යුතුය. එම නිසා වර්තමාන පරිපාලනය අධීක්ෂණය කිරීම සඳහා අධීක්ෂණ මණ්ඩලයක් අත්‍යවශ්‍යය.

### 3.2.3 අධීක්ෂණ මණ්ඩලයේ වගකීම්

I. SAITM හි වෛද්‍ය සිසුන් ගේ ඇතුලත් වීමේ සුදුසුකම්: වර්තමානයේ SAITM හි වෛද්‍ය පීඨයට ඇතුලත් වීමට අවම සුදුසුකම වන්නේ සම්මාන සාමාර්ථ 2 ක් සහ සාමාන්‍ය සාමාර්ථ 1 කි. වි.වි. ප්‍රතිපාදන කොමිසම මගින් රජයේ වෛද්‍ය පීඨයට ඇතුලත් වීමට නිර්දේශ කර තිබෙන්නේ සාමාන්‍ය සාමාර්ථ 3 ක් පමණි. මේ සම්බන්ධයෙන් වි.වි. ප්‍රතිපාදන කොමිසම සහ ශ්‍රී ලංකා වෛද්‍ය සභාව සමග ගිවිසුමක් තිබිය යුතුය.

II. පීඨාධිපති, අංශාධිපති සහ සිසුන්ගේ නියෝජිතයකු ( තෝරාගත් වර්ෂයක කණ්ඩායමක ඉහලම ලකුණු ලැබූ සිසුවකු) සමග ආසන්න සන්නිවේදනය මගින් අධ්‍යයන කටයුතු අධීක්ෂණය කිරීම.

III. මූල්‍ය කටයුතු අධීක්ෂණය කිරීම. SAITM හි වැඩිදුර සංවර්ධනය සහ සිසුන්ගේ සුභසාධනය ආදිය සම්බන්ධයෙන් වි.වි. ප්‍රතිපාදන කොමිසම, ශ්‍රී ලංකා වෛද්‍ය සභාව සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සමග ආසන්නව කටයුතු කිරීම සහ SAITM මගින් එහි උපාධි අපේක්ෂකයන් හට දෙනු ලබන පුහුණුව සහ අධ්‍යාපනය පිළිබඳ ප්‍රමිතිය අධීක්ෂණ ආයතනය විසින් අවධානය යොමු කළ යුතු අනෙකුත් කරුණුය.

SAITM සහ සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය කටයුතු අධීක්ෂණය කිරීම සඳහා නිලධාරීන් දෙදෙනෙකු පත්කළ යුතුය.

රටේ සියලුම වෛද්‍ය පීඨවල ප්‍රමිතිය පිළිබඳ සහතික වන නිදහස් ආයතනයක් පිහිටවන තුරු මෙම අධීක්ෂණ ආයතනය ක්‍රියාත්මක වනු ඇත.

### 3.2.4 අධීක්ෂණ මණ්ඩලයේ යෝජිත සැකැස්ම

I. සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ නියෝජිතයෙකු - නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් කෙනෙකු වඩා සුදුසුය (මූල්‍ය කටයුතු අධීක්ෂණය කළ යුතුය.)
II. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ සභාපති විසින් පත්කරන ලද වි.වි. ප්‍රතිපාදන කොමිසමේ/ උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශයේ සාමාජිකයකු (වි.වි. ප්‍රතිපාදන කොමිසමේ කරුණු සම්බන්ධීකරණය සඳහා)
III. ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ සභාපතිවරයා විසින් පත්කරන ලද ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ සාමාජිකයකු (ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ කරුණු සම්බන්ධීකරණයට)
IV. අධ්‍යක්ෂ, නෙවිල් ප්‍රනාන්දු ශික්ෂණ රෝහල

V. විශේෂඥ වෛද්‍ය සංගමය නියෝජනය කිරීම සඳහා SAITM ආයතනය හා බැඳුණු බාහිර සායනික විශේෂඥ වෛද්‍යවරයෙක්

VI. දෙමාපිය සංගමයෙන් පත්කරනු ලබන සාමාජිකයකු

VII. සභාපති, SAITM

VIII. SAITM ශිෂ්‍ය නියෝජිතයකු (පෙර පවත්වන ලද විභාගයේ කණ්ඩායමේ වැඩිම ලකුණු ලැබූ සිසුවකු)

IX. පීඨාධිපති, SAITM , වෛද්‍ය පීඨය

X. නීති නිලධාරි, SAITM

XI. ගණකාධිකාරි, SAITM

XII. ආයතන ප්‍රධානීන්, SAITM

## 3.3 විභාග වල ප්‍රමිතිය

### 3.3.1 SAITM ශිෂ්‍යන් සඳහා MBBS වෛද්‍ය උපාධි අවසන් වසර විභාගය

SAITM වෛද්‍ය ශිෂ්‍යන් සඳහා අවසන් උපාධි විභාගය 2016 වසරේ පවත්වන ලද පළමු හා දෙවන අවසන් වසර MBBS විභාගය පැවැත්වූ ආකාරයට වි.වි. ප්‍රතිපාදන කොමිසම විසින් රජයේ වෛද්‍ය පීඨ වලට නියම කරන ලද ප්‍රමිතීන් සහ මාර්ගෝපදේශ අනුව පැවැත්විය යුතුය. විභාගයේ ව්‍යුහය එනම් බහුවරණ ප්‍රශ්න, ව්‍යුහගත රචනා ප්‍රශ්න ගණන, දීර්ඝ සහ කෙටි කාලීන සායන විභාග වල කාල සීමාව සහ වාචික විභාගය සමාන විය යුතුය. අනෙකුත් වෛද්‍ය පීඨවල මහාචාර්යවරු සහ ජ්‍යෙෂ්ඨ කතිකාචාර්යවරු සහ ශික්ෂණ රෝහල්වල ජ්‍යෙෂ්ඨ වෛද්‍ය උපදේශකයන් වැනි බාහිර අධීක්ෂකයන් විසින් සිසුන්ගේ දැනුම පිරික්සනු ඇත. මෙතෙක් SAITM මගින් පවත්වන ලද විභාග ඉහත ප්‍රමිතීන් අනුගමනය කරමින් පවත්වා ඇත.

# 4. රජයේ වගකීම්

මෙම යෝජනාව ක්‍රියාත්මක කිරීම සඳහා උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය, සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය, ශ්‍රී ලංකා වෛද්‍ය සභාව සහ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ සහයෝගය අත්‍යවශ්‍යය. රජයේ ප්‍රතිපත්තියක් වශයෙන් පහත දැක්වෙන වගකීම් ශ්‍රී ලංකා රජය විසින් ඉහත සඳහන් අමාත්‍යාංශ, සංවිධාන සහ අධ්‍යාපන හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ පාර්ලිමේන්තු ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත පැවරෙනු ඇත.

## 4.1 උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශයේ සහ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ වගකීම්

i. අධීක්ෂණ ආයතනයේ කටයුතුවලට මැදිහත් වීම

ii. පරිපාලනය තුලින් අනෙකුත් රජයේ වෛද්‍ය පීඨ වලට සමාන වන පරිදි SAITM සඳහා පහසුකම් සැපයීම

iii. MBBS අවසාන විභාගය සායනික කොටස සඳහා තම කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ සහභාගිත්වය ලබාදෙන මෙන් රාජ්‍ය වෛද්‍ය පීඨවල පීඨාධිපතිවරුන්ට උපදෙස් දෙමින් උපාධි විභාගය සහ පොදු බහුවරණ ප්‍රශ්න පත්‍රය සඳහා SAITM සමග සම්බන්ධීකරණය කිරීම

## 4.2 සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ වගකීම

i. අධීක්ෂණ ආයතනයේ ක්‍රියාකාරකම්වලට මැදිහත් වීම

ii. නෙවිල් ප්‍රනාන්දු රෝහලට අවශ්‍ය කළමනාකාරිත්වය සහ අධ්‍යක්ෂ, උපදේශකයන්, වෙනත් වෛද්‍ය නිලධාරීන්, හෙදියන්, අතුරු වෛද්‍ය නිලධාරී කාර්ය මණ්ඩලය සහ සුලු සේවක මණ්ඩලය පත්කිරීම

iii. බාහිර අධීක්ෂකයන් වශයෙන් සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශ උපදේශකයන් නිදහස් කිරීම මගින් SAITM හි අවසාන වෛද්‍ය උපාධි විභාගය පැවැත්වීමට පහසුකම් සැපයීම

iv. සිසු තදබදය ලිහිල් වන තුරු අවිස්සාවේල්ල, මුල්ලේරියාව සහ හොරණ මූලික රෝහල් සහ 1.5.2 හි සඳහන් පළාතේ හඳුනාගත් රෝහල් සහ කඩුවෙල MOH ප්‍රදේශය සහ වෙනත් MOH ප්‍රදේශ සිසුන් සායන පුහුණුවට යැවීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම

v. නෙවිල් ප්‍රනාන්දු රෝහලට අවශ්‍ය පුනරාවර්තන වියදම්, මෙහෙයුම් සහ ප්‍රාග්ධන වියදම් සැපයීම දැරීම

vi. SAITM වෛද්‍ය උපාධිධාරීන් හඳුනාගැනීම. පවතින නිර්ණායක අනුව SAITM හි වෛද්‍ය උපාධිධාරීන් ආධුනික පුහුණුව සඳහා අනුයුක්ත කරගැනීම

vii. ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ කාරක සභා සාමාජිකයකු වශයෙන් SAITM හි වෛද්‍ය පීඨාධිපති පත් කිරීම

## 4.3 ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ වගකීම

i. SAITM හි අධීක්ෂණ ආයතනයේ කටයුතුවලට මැදිහත්වීම
ii. SAITM අවසන් වෛද්‍ය උපාධි විභාගය පැවැත්වීමේදී පහසුකම් සැපයීම
iii. SAITM හි වෛද්‍ය පීඨාධිපති මාර්ගයෙන් SAITM සඳහා පහසුකම් සැපයීම

## 4.4 SAITM හි වගකීම්

i. SAITM සිසුන්ට නිසි සායනික පුහුණුව ලබාගැනීම සඳහා නෙවිල් ප්‍රනාන්දු රෝහල ශ්‍රී ලංකා රජයට භාරදීම
ii. 20% ක පූර්ණ ශිෂ්‍යත්ව සෑම දිස්ත්‍රික්කයකින්ම රජයේ වෛද්‍ය පීඨවලට ඇතුලත් වීම සඳහා ඉතා සුලු ලකුණු ප්‍රමාණයකින් සුදුසුකම් නොලැබූ දේශීය සිසුන් හට ප්‍රදානය කිරීම
iii. සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය සහ උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය විසින් නියම කරනු ලබන මාර්ගෝපදේශ පිළිපැදීම
iv. අධීක්ෂණ ආයතනයේ පහසු ක්‍රියාකාරිත්වය සහතික කිරීම සඳහා සම්පූර්ණ සහාය ලබාදීම

# 5. ශ්‍රී ලංකාවේ පෞද්ගලික වෛද්‍ය විද්‍යා අධ්‍යාපනයේ ඉදිරි ව්‍යාප්තිය සඳහා වූ දිගු කාලීන පියවර

## 5.1 පසුබිම

උසස් පෙළින් පසු උසස් අධ්‍යාපනය සඳහා සුදුසුකම් ලබන සිසුන් තම කැමැත්ත පරිදි විෂය ක්ෂේත්‍ර අවස්ථා සොයාගත යුතුය. වෛද්‍ය විද්‍යාව හැරුන විට, ශ්‍රී ලංකාවේ සිසුන් හට ඉංජිනේරු, තොරතුරු තාක්ෂණය කළමනාකරණය සහ විද්‍යා වැනි විෂය ධාරා වලින් වෘත්තීය පාඨමාලා සඳහා අවස්ථාව ලැබේ.

දැනට ඇති එකම පුද්ගලික වෛද්‍ය විද්‍යාලය SAITM පමණි. 20% ක පූර්ණ ශිෂ්‍යත්ව පිරිනමමින් රජයේ වෛද්‍ය විද්‍යාලයට සුදුසුකම් යම්තමින් අහිමි වූ සිසුන් 20 ක් ඇතුලත් කරගත හැක. මෙම ප්‍රතිපත්තිය ඉදිරි පෞද්ගලික වෛද්‍ය විද්‍යාල වලට ද අනුගමනය කළ හැක.

## 5.2 පෞද්ගලික වෛද්‍ය අධ්‍යාපනය ස්ථාපිත කිරීම

රජයේ වෛද්‍ය විද්‍යාලයේ පවතින සීමිත ඉඩකඩ නිසා රජයේ හා පුද්ගලික අංශයේ මැදිහත්වීමෙන් වෛද්‍ය අධ්‍යාපනය සඳහා වූ ගාස්තු අයකරන වෛද්‍ය විද්‍යාල ආරම්භ කිරීම යෝජනා කරනු ලැබේ. ව්‍යාපෘතිය ආරම්භ කිරීම සඳහා කොළඹ විශ්ව විද්‍යාලය (ජාත්‍යන්තර සිසුන් ඉලක්ක කරගනිමින් කොළඹ ජාත්‍යන්තර වෛද්‍ය විද්‍යාලය වශයෙන්) සහ පේරාදෙනිය විශ්ව විද්‍යාලය සතුව සම්පත් පවතින බැවින් සහ අධ්‍යාපන ආයතන වශයෙන් ජාත්‍යන්තර පිළිගැනීමට ලක්ව ඇති බැවින් ඉතා සුදුසුය. මෙම ව්‍යාපාරයෙන් ලැබෙන ලාභය රජයේ වෛද්‍ය පීඨවල පහසුකම් වැඩිදියුණු කිරීමට යෙදවිය හැකිවීම වාසියකි.

පහසු ණය යෝජනා ක්‍රමයක් හඳුන්වාදීම මගින් ශ්‍රී ලාංකික සිසුන් බඳවා ගත හැක.

ගාල්ල, ශ්‍රී ජයවර්ධනපුර සහ කැළණිය යන අනෙකුත් අංග සම්පූර්ණ පීඨවලට අනුබද්ධව නව වෛද්‍ය විද්‍යාල ආරම්භ කළ හැක. රජයට අරමුදල් සපයන ආයතනවල දායකත්වයෙන් වඩා පහසුකම්, ශ්‍රම බලය සහ විශාල රෝගීන් සංඛ්‍යාවක් සිටින ආසන්න දිස්ත්‍රික් මහ රෝහල් වැඩිදියුණු කිරීම ආරම්භ කළ හැක. දැනට පහත සඳහන් රෝහල් කිසිම වෛද්‍ය පීඨයක් මගින් අධ්‍යාපනය ලබාදීමට භාවිත නොකරයි.

කොළඹ වෛද්‍ය පීඨය - මීගමුව රෝහල
පේරාදෙනිය වෛද්‍ය පීඨය - නුවරඑළිය රෝහල
ගාලු වෛද්‍ය පීඨය - මාතර රෝහල
ජයවර්ධනපුර වෛද්‍ය පීඨය - කලුතර රෝහල
රාගම වෛද්‍ය පීඨය - ගම්පහ රෝහල

## 5.3 රජයට ලැබෙන වාසි

i. ඍජු සහ වක්‍රාකාර වශයෙන් රැකියා අවස්ථා රාශියක් උත්පාදනය කෙරේ - වෛද්‍යවරු සහ හෙදියන් මෙන්ම අධ්‍යයන සහ අනධ්‍යන කාර්ය මණ්ඩලය

ii. දේශීය සිසුන් වෛද්‍ය අධ්‍යාපනය සඳහා විදේශ වෙත ගෙවන මුදල් නිසා අහිමි වන විදේශ විනිමය ඉතිරි කරගත හැක.

iii. රටට විදේශ විනිමය උත්පාදනය - දක්ෂ අලෙවි ක්‍රම භාවිත කරමින් විදේශ සිසුන් ආකර්ෂණය කරගනිමින් රටට විදේශ විනිමය ලබාගත හැක. (බොහෝ මැද පෙරදිග රටවල් සහ අනෙකුත් මුස්ලිම් රටවල් බටහිරට අකමැති බැවින් අපට ඔවුන් පහසුවෙන්ම ආකර්ෂණය කරගත හැක) අපේ රටේ රෝගීන් සහයෝගශීලී බැවින් සහ ආගමික හේතූන් නිසා අනෙකුත් රටවලින් නොලැබෙන පළපුරුද්දක් අපේ රටෙන් ලබා ගත හැක. තවද, අප රටේ රෝගීන් බොහොමයකට ඉංග්‍රීසි දැනුම තිබෙන බැවින් අදහස් හුවමාරු කර ගත හැක.

iv. දැනට තම වැටුප් පිළිබඳව සෑහීමට පත්වී නැති රජයේ විශ්ව විද්‍යාලවල මහාචාර්යවරු සහ කතිකාචාර්යවරුන්ගේ වැටුප් වැඩිකිරීමට ඇති රජයේ බර අවම කරගත හැක. අතිකාල දීමනා වැනි දීමනා සමග රජයේ වෛද්‍ය නිලධාරියකුගේ වැටුප රජයේ වෛද්‍ය පීඨයක ජ්‍යෙෂ්ඨ කතිකාචාර්යවරයකුගේ වැටුප මෙන් දෙගුණයකි. මෙම හේතුව නිසා වෛද්‍ය පීඨ කතිකාචාර්යවරු බඳවාගැනීම අසීරු වී ඇත. මෙම පුද්ගලික වෛද්‍ය විද්‍යාලවල බාහිර කතිකාචාර්යවරුන් ලෙස කටයුතු කිරීමට ඔවුනට පුළුවන.

v. දිස්ත්‍රික් රෝහල් ශික්ෂණ රෝහල් වශයෙන් වැඩිදියුණු කිරීම මගින් මෙම ප්‍රදේශවල ජීවත්වන රෝගීන්ට ද වාසි සැලසේ. ස්නායු, මෛත්‍රික රෝග ආදී බොහොමයක් අනු විශේෂඥ වෛද්‍යවරුන් සහ විශේෂඥ නොවන වෛද්‍යවරුන් සංඛ්‍යාව ඉහළ නැංවෙනු ඇත.

# 6. නිගමනය සහ නිර්දේශ

## 6.1 නිගමනය

I. රටේ වෛද්‍යවරුන්ගේ සංඛ්‍යාව ඉහළ නැංවීමේ කඩිනම් අවශ්‍යතාවයක් ඇත.
II. සීමිත ඉඩකඩ නිසා වෛද්‍ය පීඨවලට සුදුසුකම් ලබන සිසුන් විශාල සංඛ්‍යාවකට රජයේ පීඨ වල ඉගෙනීමට වරම් නොලැබී යයි.
III. අලුතින් වෛද්‍ය පීඨ පුළුල් කිරීමට හෝ ආරම්භ කිරීමට රජය හැකියාවක් නොමැත.
IV. රටට විශාල ලෙස විදේශ විනිමය අහිමි කරමින් විශාල සිසුන් සංඛ්‍යාවක් වෛද්‍ය අධ්‍යාපනය සඳහා විදේශගත වෙති.
V. ශ්‍රී ලංකාවේ වෛද්‍ය අධ්‍යාපනය සඳහා තිබෙන අවස්ථා පුලුල් කිරීමේ අවශ්‍යතාවක් ඇත

## 6.2 නිර්දේශ

I. පුද්ගලික අංශය සහභාගිත්වයෙන් ශ්‍රී ලංකාවේ නව වෛද්‍ය විද්‍යාල ආරම්භ කිරීම.
II. SAITM ආයතනයේ වෛද්‍ය විද්‍යාලයේ ක්‍රියාකාරිත්වය ක්‍රමවත් කිරීම
III. පැහැදිලි ප්‍රතිපත්ති තුළින් සහ මෙම ආයතන වලින් ජනතාවට ලැබෙන වාසි හුවාදක්වමින් මෙම යෝජනාව ජනතාව වෙත ප්‍රදානය කරමින් පුද්ගලික වෛද්‍ය විද්‍යා අධ්‍යාපනය සඳහා තිබෙන බාධා ඉවත් කිරීම.